ரன் சலு | RAN SALU

# පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව
# புடவைக் கைத்தொழில் திணைக்களம்
# DEPARTMENT OF TEXTILE INDUSTRY







# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# வருடாந்த செயற்பாட்டு அறிக்கை
# ANNUAL PERFORMANCE REPORT

# 2016

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය
கைத்தொழில் மற்றும் வணிக அமைச்சு
MINISTRY OF INDUSTRY AND COMMERCE

# පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව

## 01 හැදින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද 13 වන ව්‍යවස්ථා සංශෝධනය අනුව අත්යන්ත්‍ර පේෂ කර්මාන්තය සම්බන්ධ විෂය පළාත් සභා යටතට පැවරී ඇති විෂයකි. ඒ අනුව පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත්තේ එම විෂයට අදාළ ප්‍රතිපත්තිමය තීරණ හා මධ්‍යගත කටයුතු හා පළාත් සභා පේෂ කර්මාන්ත අංශ සමඟ සම්බන්ධීකරණය තුලින් කර්මාන්තයේ දියුණුවට අදාළ සේවාවන් සැපයීමයි.

### 1.1 දැක්ම

දේශීය අනන්‍යතාවය සහ සංස්කෘතියට උචිත පරිදි මෙන්ම දේශීය හා විදේශීය වෙළඳපොල ක්‍රියාකාරීත්වය ජය ගත හැකි පරිදි අත්යන්ත්‍ර පේෂකර්ම ක්ෂේත්‍රයෙහි නිර්මාණශීලි සහ තරගකාරී රෙදිපිළි නිෂ්පාදනය සඳහා නිෂ්පාදකයින් යොමු කිරීම.

### 1.2 මෙහෙවර

**රාජ්‍ය ප්‍රතිපත්ති රාමුව තුළ අත්යන්ත්‍ර පේෂකර්මාන්තය සංවර්ධනය සඳහා අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම, එකී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මග පෙන්වීම අවශ්‍ය සේවා හා පහසුකම් සැපයීම සහ මෙහෙයවීම හා සම්බන්ධීකරණය තුළින් අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රය තුල ප්‍රමාණාත්මක හා ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම.**

## 1.3 අරමුණු

- අත්‍යන්ත්‍ර පේෂකර්මාන්තය සංවර්ධනය සඳහා අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම
- නිෂ්පාදනය සංවර්ධනය අරමුණු කරගත් වැඩසටහන් සම්පාදනය කිරීම
  - ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන්
  - මෝස්තර සම්පාදන වැඩසටහන්
  - පුහුණුකරවන්නන් පුහුණු කිරීමේ වැඩසටහන්
- අත්‍යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රයේ සංවර්ධනයට අවශ්‍ය උපදේශකයින් හා කාර්යමණ්ඩල පුහුණු කිරීම
- ක්ෂේත්‍රයට අවශ්‍ය ශ්‍රමිකයින් පුහුණු කිරීම
- අලෙවි ප්‍රවර්ධනය (දේශීය හා විදේශීය අලෙවි කටයුතු සංවිධානය කිරීම)
- අත්‍යන්ත්‍ර පේෂකර්මාන්තය ව්‍යාප්ත කිරීම අරමුණු කරගත් සුදුසු ව්‍යාපෘති, ස්වයංරැකියා හා උපකාරක සේවා සැපයීම, වැඩසටහන් සංවිධානය කිරීම
- අත්‍යන්ත්‍ර පේෂකර්මාන්තයේ මෝස්තර සංවර්ධන හා ගුණාත්මක වර්ධනය අරමුණු කරගත් ප්‍රදර්ශන හා තරග පැවැත්වීම
- ජාතික අත්‍යන්ත්‍ර පේෂකර්මාන්ත ප්‍රදර්ශනය පැවැත්වීම
- අත්‍යන්ත්‍ර පේෂකර්මාන්තය වර්ධනය සඳහා අවශ්‍ය පර්යේෂණ අත්හදාබැලීම් හා සංරක්ෂණ කටයුතු
- නව තාක්ෂණය හඳුන්වාදීම හා අදාළ සංවර්ධන කටයුතු

උක්ත අරමුණු ඉටු කිරීම සඳහා පහත සඳහන් ආයතන මෙම දෙපාර්තමේන්තුව යටතේ දැනට ක්‍රියාත්මක වේ.

### i) පර්යේෂණ, පුහුණු,මෝස්තර හා සේවා ආයතනය-කටුබැද්ද

(පේෂකර්මාන්ත කෞතුකාගාරය, රසායනාගාරය ඇතුළුව)

280/1, ගාලු පාර, කටුබැද්ද, මොරටුව





### ii) ස්වාභාවික වර්ණ ව්‍යාපෘතිය, රාජගිරිය

## iii) පේෂකර්මාන්ත පුහුණු පාසැල්

පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක පේෂකර්මාන්ත පුහුණු පාසල් 13 ක් සහ මෝස්තර පුහුණු පාසල් 2 ක් වේ.

| අනු අංකය | ආයතනය | ලිපිනය |
|---|---|---|
| 01 | පෙහෙකම් සිප් පියස, කටුබැද්ද | 280/1,ගාලු පාර, කටුබැද්ද, මොරටුව |
| 02 | පෙහෙකම් සිප් පියස, කොට්ටල | කොට්ටල, වේයන්ගොඩ |
| 03 | පෙහෙකම් සිප් පියස,බෝයගනේ | බෝයගනේ, කුරුණෑගල |
| 04 | පෙහෙකම් සිප් පියස,පින්නවල | පින්නවල, රඹුක්කන |
| 05 | පෙහෙකම් සිප් පියස, වටපුළුව | අරුප්පල පාර, වටපුළුව,මහනුවර |
| 06 | පෙහෙකම් සිප් පියස,ගැටඹේ | ගැටඹේ, පේරාදෙණිය |
| 07 | පෙහෙකම් සිප් පියස,මාතලේ | කෝන්ගහමුල,පලාපත්වල,මාතලේ |
| 08 | පෙහෙකම් සිප් පියස,මාතර | හක්මන පාර, මාතර |
| 09 | පෙහෙකම් සිප් පියස,කිරම | කිරම |
| 10 | පෙහෙකම් සිප් පියස,බණ්ඩාරවෙල | කිණිගම, බණ්ඩාරවෙල |
| 11 | පෙහෙකම් සිප් පියස,තලාව | මිහිරිගම, තලාව |
| 12 | පෙහෙකම් සිප් පියස,නල්ලූර් | 194,පේදුරුතුඩුව පාර,නල්ලූර්,යාපනය |
| 13 | පෙහෙකම් සිප් පියස,සමන්තුරේ | සමන්තුරේ |
| 14 | මෝස්තර පුහුණු පාසල,කටුබැද්ද | 280/1,ගාලු පාර, කටුබැද්ද, මොරටුව |
| 15 | මෝස්තර පුහුණු පාසල,ගැටඹේ | ගැටඹේ, පේරාදෙණිය |











**2016/12/31 දිනට දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය**

| තනතුර | අනුමත කාර්ය මණ්ඩලය | තත්‍ය කාර්ය මණ්ඩලය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| | | | |
| අධ්‍යක්ෂ | 01 | 01 (වැ.බ.) | 01 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ | 02 | 01 | 01 |
| ගණකාධිකාරී | 01 | 01 | 0 |
| පේෂකර්ම තාක්ෂණ විද්‍යාඥ | 01 | 01 | 0 |
| | | | |
| | | | |
| පරිපාලන නිලධාරී | 01 | 0 | 01 |
| කාර්මික නිලධාරී | 01 | 01 | 0 |
| සංවර්ධන සහකාර/සංවර්ධන නිලධාරී | 08 | 08 | 0 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 20 | 11 | 09 |
| පේෂ උපදේශක | 61 | 51 | 10 |
| නිමහම් සහකාර | 01 | 01 | 0* |
| චිත්‍ර ප්‍රදර්ශක | 18 | 11 | 0* |
| | | | |
| | | | |
| රියැදුරු | 05 | 05 | 0 |
| කාර්යාල කාර්ය සහයක | 10 | 04 | 06 |
| මුරකරු | 18 | 17 | 01 |
| කම්කරු | 09 | 08 | 01 |
| **එකතුව** | **157** | **120** | **-** |

**නව බඳවා ගැනීම් හා විශ්‍රාම ගැනීම්**

2016 වර්ෂය තුළ මුරකරු තනතුර සඳහා 08 දෙනෙකු බඳවා ගන්නා ලදි.

2016 වර්ෂයේදී නිලධාරීන් විශ්‍රාම ගැනීම පිළිබඳ තොරතුරු පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| රාජ්‍ය කළමනාකරණ සහකාර | - 02 |
| පේෂ උපදේශක | - 04 |
| චිත්‍ර ප්‍රදර්ශක | - 01 |

# 02 2016 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය

## 2.1 ප්‍රතිපාදන උපයෝජනය

2016 වර්ෂයේ සළසා තිබූ ප්‍රතිපාදන පහත පරිදි ප්‍රතිශතයන්ගෙන් උපයෝජනය කර තිබුණි.

- මුළු ශුද්ධ පුනරාවර්තන ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස මුළු උපයෝජනය 92 %

  මුළු ශුද්ධ මූලධන ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස මුළු උපයෝජනය 100 %

| වැය විෂය | | මුළු ශුද්ධ වෙන් කිරීම **(2016 වර්ෂය)** (රු:) | මුළු වියදම (රු:) | ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ඉක්මවීම (රු:) | වියදම් ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| | <u>පුනරාවර්තන වියදම්</u> | | | | |
| 1001 | වැටුප් හා වේතන | 29,500,000 | 27,705,515.96 | 1,794,484.04 | 94% |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 840,000 | 838,869.37 | 1,130.63 | 100% |
| 1003 | වෙනත් දීමනා | 31,500,000 | 28,157,249.44 | 3,342,750.56 | 89% |
| | අනෙකුත් පුනරාවර්තන වියදම් | 10,960,000 | 10,583,401.37 | 376,598.63 | 96.5% |
| | | | | | |
| | <u>මූලධන වියදම්</u> | | | | |
| 2001 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 6,800,000 | 6,799,742.93 | 257.07 | 100% |
| 2003 | වාහන | 650,000 | 650,000 | - | 100% |
| 2102 | ගෘහ භාණ්ඩ සහ කාර්යාලයීය උපකරණ | 2,900,000 | 2,900,000 | - | 100% |
| 2401 | පුහුණුකිරීම් සහ හැකියා වර්ධනය | 22,800,000 | 22,667,645.24 | 132,354.76 | 99% |

## 2.2 ආදායම් ගිණුම්

පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව සේවා සපයන ආයතනයක් බැවින් විශේෂ ආදායම් නොමැත.

## 2.3 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී " ගිණුමේ කාර්යසාධනය

| | උපරිම හර සීමාව<br>රු: | අවම ලැබීම් සීමාව<br>රු: | උපරිම හර ශේෂ සීමාව<br>රු: |
|---|---|---|---|
| වාර්ෂික විසර්ජන ගිණුමේ සීමාවන් අමාත්‍ය මණ්ඩලය විසින් සංශෝධිත සීමාව(30301) | 5,500,000 | 3,000,000 | 25,000,000 |
| වාර්ෂික සත්‍ය වියදම | | | |
| 303011 | 5,473,698.09 | 3,380,507.09 | 13,378,580.00 |
| 303012 | 1,259,061.09 | 1,769,285.09 | |

## 3. වාර්ෂික කාර්යසාධනය

### 3.1 ගොඩනැගිලි ඉදිකිරීම හා වැඩිදියුණු කිරීමේ කටයුතු

- මාතලේ, බණ්ඩාරවෙල,තලාව, බෝයගනේ,වටපුළුව, කොට්ටල,ගැටඹේ,කටුබැද්ද පේෂ පාසල්හි ගොඩනැගිලි අළුත්වැඩියාව
- අනුරාධපුර ව්‍යාපෘති කාර්යාලයේ වැඩිදියුණුකිරීම් කටයුතු
- පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ නැවත සකස් කිරීමේ කටයුතු

## 3.2 බලවේග අංශය සම්බන්ධ කටයුතු

දෙපාර්තමේන්තුව සතුව තිබී පෞද්ගලික අංශයට විකුණනු ලැබ ඇති බලවේග ආයතන සම්බන්ධයෙන් වන කටයුතු හා එම ආයතනවල සිට රැකියා අහිමි වූ විශ්‍රාම වැටුප් හා වන්දි ඉල්ලීම් ඉදිරිපත් කරනු ලබන නිලධාරීන් සම්බන්ධයෙන් කටයුතු කිරීම මෙම අංශයෙන් සිදු වේ.

1980/81/82 වර්ෂවල පෞද්ගලීකරණය කරන ලද පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවට අයත් බලවේග ව්‍යාපාරවල වසර 10කට අඩු කාලයක් සේවය කළ සේවකයන්ට වන්දි මුදලක් ගෙවීම සඳහා අංක 12/0865515/004-1 හා 2012-07-12 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අදාළ වන්දි මුදල් ගෙවීමේ කටයුතු අවසන් කර ඇත.

2016-12-31 දින වන විට වන්දි මුදල් ලබා දෙන ලද මුළු සේවක සංඛ්‍යාව 3910ක් වන අතර රු: මිලියන 355ක මුදලක් වන්දි වශයෙන් ලබා දී ඇත.

## 3.3 පේෂකර්මාන්ත පුහුණු ව්‍යාපෘති

* පේෂකර්මාන්ත පුහුණු පාසැල් වලට සිසුන් බඳවාගෙන පුහුණු කිරීම

පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක පේෂකර්මාන්ත පුහුණු පාසැල් 13 ක් මඟින් පවත්වන පේෂකර්මාන්තය පිළිබඳ සය මාසික මූලික පුහුණු පාඨමාලාව හා මාස 13ක අවසාන සහතිකපත්‍ර පාඨමාලාව තුළින් අදාළ පුහුණුව ලබා දෙයි.

ඒ අනුව 2015/2016 අධ්‍යයන වර්ෂය (2015-07-02 සිට 2016-07-31 දක්වා) සඳහා සිසුන් 161 දෙනෙකු බඳවා ගන්නා ලද අතර 2016/2017 අධ්‍යයන වර්ෂය (2016-07-04 සිට 2017-07-31 දක්වා) සඳහා 2016 ජූලි මස බඳවා ගන්නා ලද සිසුන් සංඛ්‍යාව 157 කි.

* පේෂකර්මාන්ත මෝස්තර පුහුණු පාසැල් වලට සිසුන් බඳවාගෙන පුහුණු කිරීම

පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක මෝස්තර පුහුණු පාසැල් දෙකකි. 2016 අධ්‍යයන වර්ෂය සඳහා 2016 ජනවාරි මාසයේදී ගැටඹේ මෝස්තර පුහුණු පාසලට සිසුන් 10 ක් හා කටුබැද්ද මෝස්තර පුහුණු පාසලට සිසුන් 10 ක් ඇතුළත් විය. දෙපාර්තමේන්තුවේ පේෂකර්මාන්ත අවසාන සහතිකපත්‍ර විභාගය සමතුන් මෝස්තර පුහුණු පාඨමාලාව සඳහා ඇතුළත් වීමට සුදුසුකම් ලබයි.

## 4 අත්යන්ත්‍ර පේෂකර්මාන්ත අලෙවි ප්‍රවර්ධන වැඩසටහන්

* අත්යන්ත්‍ර පේෂකර්මාන්ත අලෙවි සල්පිල

දේශීය අත්යන්ත්‍ර පේෂකර්මාන්ත නිෂ්පාදකයින් සඳහා වෙළඳපල අවස්ථා උදාකරදීමෙන් ජනතාව අතර අත්යන්ත්‍ර රෙදිපිළි ජනප්‍රිය කිරීමත් ඒ සඳහා වැඩි ඉල්ලුමක් ඇති කිරීමත් අරමුණු කර ගෙන 2016 මාර්තු මස 25-27 දිනයන්හිදී බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර ශාලා පරිශ්‍රයේදී පවත්වන ලදි.







* ජාතික අත්යන්ත්‍ර රෙදිපිළි තරඟය, ප්‍රදර්ශනය හා සම්මාන උළෙල

අත්යන්ත්‍ර පේෂකර්මාන්තයේ ගුණාත්මක බව වර්ධනය කිරීම සඳහා දේශීය හා විදේශීය වෙළඳපොළ අරමුණු කොට දේශීය රෙදිපිළි නිර්මාණය කරන අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රයේ නියැලෙන්නන්ගේ හැකියාවන් ඔප් නැංවීම, දිරි ගැන්වීම හා ඔවුන්ගේ කුසලතා අගය කිරීම සඳහා වාර්ෂිකව පවත්වන ජාතික අත්යන්ත්‍ර රෙදිපිළි තරඟය, ප්‍රදර්ශනය හා සම්මාන උළෙල 2016 දෙසැම්බර් මස 09 – 11 දිනයන්හි බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර ශාලා පරිශ්‍රයේදී පවත්වන්නට යෙදින.





















Department of Textile Industry


EXIT
Department of Textile Industry


EXIT



**5 සේවාස්ථ පුහුණු වැඩසටහන**

I. පේෂකර්මාන්ත කළමණාකරුවන්, ව්‍යවසායකයින් හා උපදේශකයින් දක්වා විහිදී යන පරිදි පේෂකර්මාන්තයේ වර්ධනය සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් හා වැඩමුළු සංවිධානය කිරීම හා ක්‍රියාත්මක කිරීම මේ යටතේ සිදුවේ.

පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය, පළාත් රාජ්‍ය, සමුපකාර, පෞද්ගලික අංශයේ අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රයේ නියුතුවූවන්ගේ ඵලදායීතාවය වර්ධනය කිරීමේ අරමුණින් 2016 වර්ෂයේදී පුහුණුලාභීන් 974 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන් 36ක් පවත්වන ලදි.
(පේෂකර්මාන්ත ක්ෂේත්‍රයට අදාළ පුහුණු වැඩසටහන් 26ක්, නිපුණතා සංවර්ධන වැඩසටහන් 02ක්, පේෂ පාසල් සිසුන් සඳහා පෞරුෂත්ව වැඩසටහන් 03ක් හා ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා 05 ක් වශයෙනි)



**6 විභාග පැවැත්වීම**

<u>පේෂකර්මාන්ත පුහුණු පාඨමාලා සම්බන්ධ විභාග කටයුතු</u>

- පේෂකර්මාන්ත අවසාන සහතිකපත්‍ර හා මූලික පුහුණු පාඨමාලාවන්ට අදාළ විභාග කටයුතු 2016 ජූලි මස 26-28 දිනයන්හි පවත්වන ලදි. මේ සඳහා පේෂ පාසල් සිසුන් 127 දෙනෙකු හා බාහිර අයදුම්කරුවන් 57 දෙනෙකු පෙනී සිටි අතර පේෂ පාසල් සිසුන් දෙදෙනෙකු හා බාහිර අපේක්ෂකයින් 12 දෙනෙකු විභාගය සඳහා සහභාගි නොවීය.

| විභාග මධ්‍යස්ථානය | පේෂ පාසල් සිසුන් | | බාහිර අයදුම්කරුවන් | |
|---|---|---|---|---|
| | පැමිණි | නොපැමිණි | පැමිණි | නොපැමිණි |
| කොට්ටල | 12 | - | 03 | 02 |
| කටුබැද්ද | 12 | - | 06 | 01 |
| ගැටඹේ | 13 | - | 06 | - |
| කිරම | 10 | - | 02 | - |
| බෝයගනේ | 22 | 01 | 01 | 01 |
| මාතලේ | 05 | - | 09 | - |
| බණ්ඩාරවෙල | 08 | - | 09 | - |
| මාතර | 06 | - | 02 | 02 |
| වටපුළුව | 19 | 01 | - | - |
| පින්නවල | 12 | - | - | - |
| සමන්තුරේ | 05 | - | 11 | 05 |
| නල්ලූර් | 03 | - | 08 | 01 |
| **එකතුව** | **127** | **02** | **57** | **12** |

- එක් අවුරුදු මෝස්තර පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා 2016 ජනවාරි මස බඳවා ගන්නා ලද සිසුන් සඳහා පාඨමාලාව අවසානයේ පවත්වන පරීක්ෂණය 2017 ජනවාරි මස 25-27 යන දිනයන්හි පැවැත්වීමට අවශ්‍ය කටයුතු සැළසුම් කරන ලදි. ඒ සඳහා ගැටඹේ මෝස්තර පුහුණු පාසලේ සිසුන් 10 දෙනෙකු හා කටුබැද්ද මෝස්තර පුහුණු පාසලේ සිසුන් 09 දෙනෙකු පෙනී සිටීමට නියමිතය.

<u>දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා පැවැත්වෙන කාර්යක්ෂමතා කඩඉම් විභාග</u>

- දෙපාර්තමේන්තුවේ පේෂ උපදේශක තනතුරෙහි සේවය කරන නිලධාරීන් 31 දෙනෙකු සඳහා අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2016-07-02 වන දින දෙපාර්තමේන්තුවේ කටුබැද්ද අංශයේදී පවත්වන්නට යෙදිනි.

## 07 පුහුණු හා හැකියා වර්ධන කටයුතු

**2016 වර්ෂය තුළ දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ දේශීය හා විදේශීය පුහුණු අවස්ථා/ සහභාගි වූ වැඩමුළු පිළිබඳ විස්තර පහත පරිදි වේ.**

| පුහුණු පාඨමාලාව / වැඩසටහන | පුහුණුකාලය/ වැඩසටහන පැවැත්වූ කාලය (දින | දේශීය/ විදේශීය | සහභාගි වූ නිලධාරීන් ගණන |
|---|---|---|---|
| රාජ්‍ය ලේඛන කළමණාකරණය සහ සංරක්ෂණය පාළීබඳ එක්දින වැඩමුළුව | දින 01 | දේශීය | **01** |
| තොරතුරු තාක්ෂණ භාණ්ඩ ප්‍රසම්පාදනය හා ලංසු ඇගයීම. | දින 01 | දේශීය | **01** |
| ප්‍රසම්පාදන ක්‍රියාවලිය | දින 02 | දේශීය | **02** |
| ආයන සංග්‍රහයේ විධි විධාන පිළිබඳව රාජ්‍ය කළමණාකරණ සහකාර සේවයේ නිලධරයන් දැනුවත් කිරීමේ වැඩසටහන | දින 02 | දේශීය | **02** |
| ආයන සංග්‍රහයේ විධි විධාන පිළිබඳව රාජ්‍ය කළමණාකරණ සහකාර සේවයේ නිලධරයන් දැනුවත් කිරීමේ වැඩසටහන | දින 02 | දේශීය | **01** |
| ආයන සංග්‍රහයේ විධි විධාන පිළිබඳව රාජ්‍ය කළමණාකරණ සහකාර සේවයේ නිලධරයන් දැනුවත් කිරීමේ වැඩසටහන | දින 02 | දේශීය | **02** |
| ප්‍රසම්පාදන මූලධර්ම හා ප්‍රසම්පාදන සැලසුම් | දින 01 | දේශීය | **01** |
| ලංසු කැඳවීමේ පරිපාටිය | දින 01 | දේශීය | **01** |
| ලංසු ලියවිලි සැකසීම | දින 01 | දේශීය | **01** |
| ලංසු ඇගයීම | දින 01 | දේශීය | **01** |

**08** වඩාත් ඵලදායී ජීවනෝපාය මාර්ගයක් ලෙස අත්යන්ත්‍ර පේෂකර්මාන්තය ග්‍රාමීය මට්ටමෙන් ව්‍යාප්තකරලීමේ අරමුණෙන් කුරුණෑගල, මාතර හා මඩකලපුව යන දිස්ත්‍රික්කයන්ට අයත් වාරියපොළ, වැල්ලව, තලල්ල හා පාලමුණ යන ප්‍රදේශවල ප්‍රතිලාභීන් 41 දෙනෙකු සඳහා අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ව්‍යාපෘති ආරම්භ කරන ලදි.

09 කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් දිවයිනේ විවිධ දිස්ත්‍රික්කයන් ආවරණය වන පරිදි අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ව්‍යාපෘති ආරම්භ කරන ලදි.

හිඟුරක්ගොඩ, ලුණුගම්වෙහෙර, දෙහිඅත්තකණ්ඩිය, වාලච්චේන, වැලිකන්ද, මරදමුණ සහ කෑගල්ල දිස්ත්‍රික්කයේ බෝපිටිය, රඹුක්කන (උඩුගම), මහපල්ලේගම හා තෝලංගමුව යන ප්‍රදේශවල තෝරාගත් ප්‍රතිලාභීන් සඳහා අත්යන්ත්‍ර පේෂ කර්මාන්තය පිළිබඳ මාස හයක පුහුණුව ලබා දීමෙන් පසු කර්මාන්තය ආරම්භ කිරීම සඳහා අවශ්‍ය අත්යන්ත්‍ර, මූලික උපකරණ හා අමුද්‍රව්‍ය නොමිලේ ලබා දීමෙන් අනතුරුව පුහුණුව ලද ප්‍රතිලාභීන් කර්මාන්තගත කිරීමට කටයුතු කරන ලද අතර කර්මාන්තයේ නිරත දේශීය නිෂ්පාදකයන් දිරි ගැන්වීමේ අරමුණෙන් ඔවුන් සඳහා අවශ්‍ය අත්යන්ත්‍ර උපකරණ නොමිලේ බෙදා දෙන ලදි.













10 පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ පවත්වාගෙන යනු ලබන පේෂකර්මාන්ත පුහුණු පාසල්, ව්‍යාපෘති මධ්‍යස්ථාන හා අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ව්‍යාපෘති සඳහා අවශ්‍ය නූල් හා උපකරණ ද ප්‍රධාන කාර්යාලය සඳහා අවශ්‍ය ගෘහ භාණ්ඩ උපකරණ ද මිලදී ගන්නා ලදි.

11 පේෂකර්මාන්ත පුහුණු පාසල්වල පේෂකර්මාන්ත පුහුණු පාඨමාලාව හදාරණ සිසුන් සඳහා පවත්වන ඉංග්‍රීසි පුහුණු පාඨමාලාව 2016 වර්ෂය තුළ ද ක්‍රියාත්මක කරන ලදි.

12 2016 වර්ෂයේ ජාතික අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ප්‍රදර්ශනය සඳහා සහභාගි වන දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා නිල ඇඳුමක් සකස් කරන ලදි.

13 පේෂකර්මාන්ත පුහුණු පාසල්හි ඉගෙනුම ලබන සියළුම සිසුන් සඳහා 2016 වර්ෂයේදීද නිල ඇඳුම් කට්ටල 02 බැගින් ලබා දෙන ලදි.

14 රජය මඟින් දහම් පාසල් ගුරුවරුන් වෙත නොමිලේ බෙදා දෙනු ලබන දහම් පාසල් සාරි 68,000ක් සඳහා බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂයට අදාළව ලබා දුන් ඇණවුම, පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි නිෂ්පාදකයින් මඟින් පහත සඳහන් පරිදි සම්පූර්ණ කර ලබා දෙන ලදි.

| | සැපයුම්කරු | සපයන ලද සාරි සංඛ්‍යාව |
|---|---|---|
| 01 | සන්ටෙක්ස් වීවින් ඉන්ඩස්ට්‍රීස් (පුද්)සමාගම | 7000 |
| 02 | එස්.එල්.ආර්.හෝල්ඩිංග්ස් | 7000 |
| 03 | අයේෂා වීවින් | 7000 |
| 04 | හෙලසළු වීවින් | 7000 |
| 05 | මරඳගහමුල පේෂ සමූපකාර සමිතිය | 5000 |
| 06 | ඩී.දිසානායක පෙහෙකම්හල | 7000 |
| 07 | කුරුණෑගල පේෂ සමූපකාර සමිතිය | 5000 |
| 08 | සී/ස පේෂකර්මාන්ත සමූපකාර සංගමය | 5000 |
| 09 | බටපොල හෑන්ඩ්ලූම්ස් | 1000 |
| 10 | ඉහල මඩම්පැල්ල අත්යන්ත්‍ර සුභ සාධක සමිතිය | 3000 |
| 11 | ඊ.ඒ.ප්‍රැන්ක් ටයිටස් මයා (ඔරයන් ටෙක්ස්ටයිල්) | 2000 |
| 12 | කේ.එස්.හසිත එරංග මයා (සුප්‍රීම් වීවින්) | 1000 |
| 13 | ඩැග්මා ජෝදි පලගසාමි මිය (සුජී හෑන්ඩ්ලූම්ස්) | 1000 |
| 14 | සී/ස කැළණි ෆැබ්රික් (පුද්) සමාගම | 1995 |
| 15 | සී/ස ලංකා සළුසල | 1000 |
| 16 | කැන්ඩි ෆැබ්රික් (පුද්ගලික) සමාගම | 500 |
| 17 | දිලිනි සහ මධුෂි නිෂ්පාදන | 2000 |
| 18 | ඩී.ජේ.ප්‍රඩක්ස් | 3000 |
| 19 | කොට්ටල ලිය සහන සුභ සාධක සමිතිය | 1000 |
| 20 | ජේ.කේ.ප්‍රඩක්ස් | 500 |

15 2016 වර්ෂය තුළ NB – 3003, PD-4265, KC-7670, 51-5959 යන දෙපාර්තමේන්තුවට අයත් වාහන අලුත්වැඩියා කටයුතු සිදු කරන ලදි.

16 පුහුණු මධ්‍යස්ථාන ආකර්ශනීය ලෙස පවත්වාගෙන යාම තුළින් වැඩි පුහුණුලාභීන් පිරිසක් ඇතුළත් කර ගැනීමේ අරමුණෙන් සමන්තුරේ, කටුබැද්ද, පින්නවල, බණ්ඩාරවෙල, ගැටඹේ, වටපුළුව, මාතලේ, මාතර පේෂ කර්මාන්ත පුහුණු පාසල් ගොඩනැගිලිවල තීන්ත ආලේප කිරීම සඳහා ආම්පන්න මිලදී ගැනීම කරන ලදි.

# 2016 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්

## කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කළ වැඩසටහන්

### පේෂ කර්මාන්ත ගම්මාන වැඩසටහන

| ව්‍යාපෘතිය | ප්‍රතිලාභීන් ගණන | ව්‍යාපෘතියේ වටිනාකම (රු.මි.) |
|---|---|---|
| මරදමුන | 90 | 10.000 |
| වාලච්චේන | 35 | 4.200 |
| දෙහිඅත්තකණ්ඩිය | 20 | 2.500 |
| වැලිකන්ද | 11 | 2.500 |
| හිඟුරක්ගොඩ | 04 | 2.500 |
| ලුණුගම්වෙහෙර | 20 | 2.500 |
| කැගල්ල | 60 | 10.00 |
| | | |
| දෙහිඅත්තකන්ඩිය | 08 | |
| උහන | 17 | |
| දමන | 08 | |
| සායින්දමරුදු | 09 | |
| අඩ්ඩාලච්චේන | 15 | 13.570 |
| සමන්තුරේ | 18 | |
| ආලයඩිවෙම්බු | 11 | |
| කාරතිවු | 25 | |
| අල්හමර් සමූපකාර සමිතිය | 41 | |

## පේෂ කර්මාන්ත සමූපකාර සමිති සඳහා අත්යන්ත්‍ර ලබාදීම

(වටිනාකම රු.මි. 3.400)

| සමූපකාර සමිතියේ නම | අත්යන්ත්‍ර | වයින්ඩින් යන්ත්‍ර |
|---|---|---|
| ශ්‍රී ලංකා පේෂ කාර්මිකයින්ගේ සමූපකාර සංගමය | 05 | 05 |
| සී/ස මීරිගම පේෂ කාර්මිකයන්ගේ සමූපකාර සමිතිය | 05 | 05 |
| සී/ස කොට්ටාව පේෂ කාර්මිකයන්ගේ සමූපකාර සමිතිය | 05 | 05 |
| සී/ස නුවර කලාවිය පේෂ කාර්මිකයන්ගේ සමූපකාර සමිතිය | 05 | 05 |
| සී/ස තුන්කෝරළේ පේෂ කාර්මිකයන්ගේ සමූපකාර සමිතිය | 05 | 05 |
| සී/ස කෑගල්ල පේෂ කාර්මිකයන්ගේ සමූපකාර සමිතිය | 05 | 05 |
| සී/ස කුළියාපිටිය පේෂ කාර්මිකයන්ගේ සමූපකාර සමිතිය | 05 | 05 |
| සී/ස කුරුණෑගල පේෂ කාර්මිකයන්ගේ සමූපකාර සමිතිය | 05 | 05 |
| සී/ස මහනුවර පේෂ කාර්මිකයන්ගේ සමූපකාර සමිතිය | 05 | 05 |
| සී/ස මාතලේ පේෂ කාර්මිකයන්ගේ සමූපකාර සමිතිය | 05 | 05 |
| සී/ස කඩවත පේෂ කාර්මිකයන්ගේ සමූපකාර සමිතිය | 05 | 05 |

## ජේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කළ වැඩසටහන්

### ග්‍රාමීය කාන්තාවන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | ප්‍රතිලාභීන් ගණන | ව්‍යාපෘතියේ වටිනාකම (රු.මි.) |
|---|---|---|
| වැල්ලව | 07 | 0.900 |
| වාරියපොල | 11 | 1.320 |
| තලල්ල | 12 | 1.440 |
| කිතුල්වල | 08 | 1.000 |
| පාලමුණ | 15 | 1.800 |